*සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.*

# I පත්‍රය

❖ **මුලින් ම දී ඇති පදයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරන්න.**

1. කැත්තට පොල්ල වගේ
   - I. වැරදි අවබෝධයකින් සිටීම — II. එකට එක කිරීම
   - III. අවසාන උත්සාහයක් දැරීම — IV. නිශ්ඵල ක්‍රියාවක යෙදීම

2. කුනිස්සන්ට දැල් දනවා
   - I. කුනිස්සන් ඇල්ලීම — II. නිශ්ඵල ක්‍රියාවක යෙදීම
   - III. බොරු සෙනෙහසක් පෙන්වීම — IV. බලය පිරිහීම

3. කිඹුල් කඳුලු හෙළීම
   - I. බොරු සෙනෙහසක් පෙන්වීම — II. බොරු කියමින් මවා පෑම
   - III. දරුවෙකුගේ අකීකරුකම — IV. කිඹුලෙක් හැඬීම

❖ **මුල් පදය ට විරුද්ධ පදය යටින් ඉරක් අඳින්න.**

4. මිතුරු — I. යහළුවා II. සකි II. මිතුරි IV. සතුරු

5. උදක — I. සුදු II. ජලය III. නිරුදක IV. දහවල්

6. රෝගී — I. නිරෝගී II. අසනීප III. සනීප IV. ලෙඩ

❖ **පහත දැක්වෙන පදයට සමාන පදය තෝරන්න.**

7. කන — I. කණ II. සවන III. ශ්‍රවණය IV. ඇසීම

8. සතුට — I. ශෝකය II. දුක III. සොම්නස IV. දෙම්නස

❖ **අක්ෂර වින්‍යාසය නිවැරදි වචනය තෝරන්න.**

9.
   - I. රැල II. මුල III. වල IV. කැල

10.
   - I. තීක්ෂණ II. පරිඝනකය III. පරිගනකය IV. තීක්ෂන

❖ **අකාරාදී පිළිවෙළින් ලියවුණ පද පේළිය යටින් ඉරක් අඳින්න.**

11.

I. කොටි, අලි, නරි, ඌරු, වලස් II. පත්තක්කා, පතාක, පතෝල, පපඩම්
III. කොන්ද, කැන්ද, කන්ද, කෙන්ද IV. කිරි, කැකිරි, කලු, කතුර

12.

I. කොටියා, අලියා, නරියා, වලහා II. අලියා, ඌරා, කොටියා, නරියා
III. අලියා, ඌරා, නරියා, කොටියා IV. ඌරා, අලියා, කොටියා, නරියා

13. මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, ආශිර්වාද ක්‍රියා පිළිවෙළින් ඇත්තේ,

I. කඩමින්, දුවන්න, ජයවේවා II. සෙත්වේවා, දුවන්න, අඬ අඬා
III. දුව දුවා, ගයමින්, දුවන්න IV. දුවමින්, යන්න, ගය ගයා

14. උපමාවක් සහිත පද්‍ය පාඨය තෝරන්න.

I. ඉරු දෙව් බබළවයි පහන
II. තෙද බල විකුම් පෑ පැරකුම් නැමුණු වගේ
III. පොළවේ සුදු මල් පිපිලා
IV. සමන් පිච්ච මල් ඉහිරුණු නිල් තණකොළ පිට්ටනියක්

15. අනුක්ත පද සහිත පේළිය තෝරන්න.

I. කුරුල්ලන්, ළමයකු, නොලියක II. ළමයෙක්, සහෝදරයක්, මිනිස්සු
III. හාවෙක්, ළමයකු, මනාලියක් IV. කුරුල්ලා, හාවෙක්, සහෝදරයක්

16. "ස්ථිර තීරණයක් නොමැතිවීම" ගැළපෙන ප්‍රස්තාව පිරුල වන්නේ,

I. එකට කෑවට බොක්ක වෙනස් ලු
II. ඇටි කෙහෙල් කාපු උගුඩුවා වගේ
III. බල්ලෙක් බිරුවට කන්දක් පාත් වෙයිද?
IV. මඩේ හිටවපු ඉන්න වගේ

17. සමාන අර්ථ ඇති පද 2 ක් එකතුවී සෑදෙන යුගල පදය වන්නේ,

I. ළමයි බමයි II. රොඩු - බොඩු III. සැප පහසු IV. අඩුම කුඩුම

❖ **හිස්තැන් පුරවන්න.**

18. තාරකාවෝ රාත්‍රී අහසේ .............................. (දිලිසෙයි / දිලිසෙති / දිලිසුනාය)

19. ............................... මීයන් අල්ලති. (පූසා / පූසෝ / පූසෙකු)

20. .............................. දරුවන්ට අවවාද කරති. (මෑණියෝ / ආච්චි / මෑණියන්)

## II පත්‍රය

01. ඔබට ක්‍රියාකාරකමක් ලෙස ජන කතා රැස්කර පොතක් සෑදීමට තිබුණි. එහි කළ නිර්මාණය ඇසුරින් පිළිතුරු ලියන්න.

I. එයට යෙදූ නම කුමක්ද?
II. එහි ඇතුළත් කර ඇති ජනකතා 2 ක් සඳහන් කරන්න. (නම)
III. එහිදී ඔබට ඇතිවූ ගැටළු මොනවාද? 2 ක් ලියන්න.
IV. එම ගැටළු විසඳ ගත් ආකාරය ලියන්න.
V. ඔබ එයින් ලැබූ අත්දැකීම් 2 ක් ලියන්න.

02. ලොව පුරා කොවිඩ්-19 වසංගතය පැතිර ඇති නිසා එයින් ආරක්ෂා වීමට ජනයා දැනුවත් කරමින් දැන්වීමක් සකසන්න. (පහත කරුණු පිළිබඳ අවධානය යොමු කරන්න)

- වසංගතයේ වර්තමාන තත්වය
- එය බෝවන ආකාරය
- එහි ඇති දරුණු බව හා වැළකිය හැකි ක්‍රම

03. පහත මාතෘකාවලින් එකක් තෝරා වචන 175 කට නොඅඩු රචනයක් ලියන්න.

I. මතු රැකෙනා ශිල්පයමයි උගතමනා
II. කියවීමෙන් ලැබිය හැකි ප්‍රයෝජන
III. නුවණින් මෙන්ම ගුණයෙන් ද යුතු පුද්ගලයෙක් වෙමු
IV. පැරණි ජන සාහිත්‍යයෙන් අප ලැබූ දයාද

04. පෙළ පොතේ පාඩම් ඇසුරින් පිළිතුරු ලියන්න.
මේ කියමන් කා විසින් කා ට කියන ලදද? කුමන පාඩමේ ද?

I. "මොනවද? මේ තාල කියන්නේ?"
II. "හරි පුදුමයි නෙ තාත්තෙ. මම දැනගෙන හිටියෙ නෑනේ ඒ බව"
III. "පොහොසත් අයගෙ මුදල් දෙතොත්
ගරු නාමෙත් පදවිත් පතා" ඉතිරි පද පුරවන්න.
IV. ........................................................................
........................................................................
සිසිල් සුළං දැල් විදින්නට
දෙරට යන්න හොඳ වේලාව පුරවන්න.
V. ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි ලියූ කෘති 4 ක් දක්වන්න.

05. වෙන වෙන හොඳ පාට ඇඳුම් - ඇඳගත් පොඩි ළමයි පෙළක්
වගෙයි නේද මේ ගස් ටික - නොයෙක් පාට මල් පිපිලා

මගෙ නංගිගෙ පොඩි හිනාව - වගේය මේ පිච්ච පොකුර
ඇගෙ කම්මුල් දෙකේ පාට - කොයින්ද මේ පිච්ච මලට

I. මෙම නිර්මාණය ලියුවේ කවුද?
II. මෙහි ඇති උපමාවක් ලියන්න.
III. පොඩි ළමයි කුමන ආකාරයෙන් පෙනේද?
IV. කාව්‍ය නිර්මාණයේ භාවිතා කරන උපක්‍රමයක් පද්‍ය ඇසුරින් පහදන්න.
V. මෙවැනි නිර්මාණ කළ තවත් කවියෙකු ලියන්න.

# පැවරුම්

01. 7 වන පාඩමේ සිට 14 පාඩම දක්වා සියලු පාඩම් කියවන්න.

02. පාඩම කියවා දෙමාපිය අත්සන පාඩම අවසානයේ යොදන්න.

03. එම පාඩම් ඇසුරින් එක් පාඩමකින් ප්‍රශ්න 15 බැගින් සකසා පිළිතුරු සපයන්න.

04. දිනකට එක බැගින් රචනයක් ලියන්න.

I. පොලිතීන් භාවිතය දුරු කර - පරිසරය සුරකිමු
II. සාරධර්ම සුරකිමු
III. රබීන්ද්‍රනාත් තාගෝර්ගෙන් ගත හැකි ජීවන පාඩම්
IV. උගතමනා ශිල්පයමයි මතු රැකෙනා
V. මත් රකුසාගෙන් අනාගත පරපුර සුරකිමු
VI. කෘෂි තාක්ෂණය භාවිතයෙන් ආහාර නිෂ්පාදනය ඉහළට
VII. අපේ පැරණි සාහිත්‍යය
VIII. කියවීම මිනිසා සම්පූර්ණ කරයි
IX. අපේ ආහාර රටාව නිරෝගී දිවියට මග පාදයි
X. නීරෝගීව දිවි ගෙවීමට සෞඛ්‍ය පුරුදු පිළිපදිමු